සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# අනාවරණ පරීක්ෂණය 2021

**08 ශ්‍රේණිය** # පුරවැසි අධ්‍යාපනය **කාලය පැය 02 යි.**

නම/ විභාග අංකය:

## I - කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමිවේ.
- ප්‍රශ්න අංක 01- 05 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියා දක්වන්න.

01. මිනිසාගේ අවශ්‍යතා ............................................................. වීම පොදු සේවා තවදුරටත් වර්ධනය කිරීමට හේතු වේ.

(සරල, සංකීර්ණ, දියුණු)

02. ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක ජීවත්වන සියලු පුරවැසියන්ට පුරවැසියන් ................................................ අවස්ථා හිමිවිය යුතුය. (සමාන, විශේෂ, වැඩි)

03. දැරිය හැකි ජීවන රටාවකට අනුගත වෙමින් රටක............................................................................ජනතාව දායකවීම යහපත් ලක්ෂණයකි. (සංවර්ධනයට, දියුණුවට, සංවර්ධනයට)

04. මාර්ග සංඥා වලින් කියවෙන දේ හොඳින් අවබෝධ කොට ගෙන ඒවා පිළිපදිමින් රිය පැදවීම ............................................................................ රියදුරකුගේ වගකීමකි. (විනීත, බුද්ධිමත්, හොඳ)

05. තමන් කරන රැකියාව පිළිබඳ ශ්‍රමාභිමානයක් ඇති කර ගැනීමෙන් තෘප්තිමත්ව රැකියාවෙහි නිරත වීමට ........................................................ හැකි වනු ඇත.

(සේවා ලාභියාට, සේවා යෝජකයාට, සේවා දායකයාට)

- ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවල දැක්වන ප්‍රකාශ හරිනම් (✓) ලකුණ ද වැරදිනම් (×) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

06. ශ්‍රී ලංකාව මෑතක සිට ස්වභාවික ආපදා බහුල රටක් බවට පත්ව තිබේ. ( )

07. සතුන්ට වඩා ඉක්මනින් මිනිසුන්ට පරිසරයේ වෙනස්කම් හඳුනා ගැනීමේ හැකියාව පවතී. ( )

08. වැඩ ලෝකය තුළ සාමූහිකව කටයුතු කිරීම මෙන්ම පෞද්ගලිකවත් තම කාර්ය සාධනය ඉහළ නංවා ගැනීම අවශ්‍යය. ( )

09. සෑම මොහොතකම පවත්නා තත්වය හා තමා අපේක්ෂා කරන දෙය එලෙසින්ම ඉටු කර ගැනීමට නොහැකි වීම අතර ඇති වෙනස ගැටලුවක් ලෙස අර්ථදැකවිය හැකිය. ( )

10. ජීවිතයේ ඕනෑම අවස්ථාවක ඕනෑම ස්ථානයක දී අනතුරුවලට හා විපත් වලට මුහුණ දීමට සිදු නොවේ.

( )

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11. ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ක්‍රියාත්මකවන ජාත්‍යන්තර ආයතනයක් වන්නේ මින් කුමක් ද?

    (1) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

    (2) යුනිසෙෆ් ආයතනය

    (3) ළමා ආරක්ෂක අධිකාරිය

    (4) පරිවාස හා ළමා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

12. බහු සංස්කෘතික සමාජයක ජීවත්වන පුද්ගලයෙකු විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංගයක් වන්නේ,

    (1) තම සංස්කෘතිය උසස් යයි අන් අය සමග තර්ක කිරීමය.

    (2) තම ජන වර්ගයට අයත් පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමයි.

    (3) සෑම ජන වර්ගයකටම අයත් පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමයි.

    (4) අන්‍ය ආගම්වලට ගරු කිරීමයි.

13. මෑත ඉතිහාසයේ ලංකාවේ ඇති වූ විපත් අතරින් ඉතාමත් දරුණුතම ස්වාභාවික විපත වන්නේ මින් කුමක්ද?

    (1) මීතොට මුල්ල කුණු කන්ද නාය යාම. (2) සාලාව අවි ගබඩාව පිපිරීම.

    (3) 2019 අප්‍රේල් 21 ඇති වූ පාස්කු ප්‍රහාරය. (4) 2004 වර්ෂයේ ඇති වූ සුනාමි ඛේදවාචකය.

14. කාලගුණික සහ දේශගුණික තත්වයන්ගේ වෙනස් වීම් නිරන්තරයෙන් සන්නිවේදන මාධ්‍යයන් හට ලබා දීමට කටයුතු කරන ආයතනය කුමක් ද?

    (1) කලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව (2) ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

    (3) ආරක්ෂක අංශ (4) රතු කුරුස සංවිධානය

15. පුහුණු ශ්‍රමිකයෙක් තුළ දක්නට ලැබෙන ලක්ෂණ ඇතුළත් පිළිතුර තෝරන්න.

    (1) අධ්‍යාපනය තුළින් දැනුම ලබාගත් අයෙකු වීම.

    (2) තම රැකියාවට අනුව හා වෘත්තීය දැනුම ලබාගත් අයෙකු වීම.

    (3) විශේෂ කුසලතා ඇති අයෙකු වීම.

    (4) දැනුම සහ ආකල්ප වලින් යුතු පුද්ගලයෙකු වීම.

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු ඉතාමත් ගැලපෙන පිළිතුරු ලියන්න.**

16. යම් ප්‍රජාවකගේ අවශ්‍යතා සපුරාලීමට ජල සැපයුම ප්‍රමාණවත් නොවන විට ඇතිවන තත්වය හඳුන්වන්නේ ........................................................................ නමින්.

17. මහම්මත් නබි තුමාගේ උපන්දිනය සිහි කරමින් දුගීමගී යාචකයින්ට දන්දීම ........................................................ උත්සවයේ ප්‍රධාන තැනක් ගනී.

18. කර්මාන්තශාලා වල වැඩකරන කම්කරුවන් මේසන්වරුන් වැනි අය කරන රැකියා ........................................ වශයෙන් හැඳින්වේ.

19. 'යුතුකම් අගය' නැමති කවි පෙළ .............................................................................. විසින් රචිත පද්‍ය පංතියකි.


20. තම වගකීම් නිසි ලෙස ඉටු කරන්නේ නම් ඒ හා සමානව තමාට ................................................... ද හිමි වේ.

**<u>II - කොටස</u>**

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න 04 ක් තෝරාගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නය සඳහා ලකුණු 16 ක්ද අනෙක් ප්‍රශ්න සඳහා ලකුණු 11 බැගින් ද හිමි වේ.**
- **පිළිතුරු ලිවීම සඳහා වෙනම කඩදාසි භාවිතා කරන්න.**

01 වර්තමානයේ ගැටලු ඇතිවීම සාමාන්‍ය සංසිද්ධියක් බවට පත්ව ඇත.

(i) පහත රූපයේ හිස්තැන් වලට සුදුසු ගැටලු වර්ග ලියන්න.




(ලකුණු 03)


(ii) ගැටලු විසඳා ගැනීමෙන් ලැබෙන ප්‍රයෝජන 4 ක් ලියන්න. (ලකුණු 04)

(iii) කොළඹ විශාකා විද්‍යාලයේ 8 -A ශ්‍රේණියේ ශිෂ්‍යාවන් 40 ක් සිටිති. එම ශ්‍රේණියේ ශිෂ්‍යාවන් ගණිතය විෂය සඳහා ඉහළ සාධන මට්ටමක් පෙන්වා ඇත. නමුත් ඕෂධී නම් ශිෂ්‍යාව ගණිතය විෂය සඳහා දුර්වල වී ඇත.

A ඇයට එසේ වීමට බලපා හැකි හේතු 03 ක් ලියන්න. (ලකුණු 03)

B ඇයට ගණිතය විෂයේ සාධන මට්ටම ඉහළ දමා ගැනීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග 03ක් ලියන්න. (ලකුණු 03)


(iv) පහත පිංතූර වලින් දක්වෙන්නේ ගැටලු වලට මුහුණ දී අභියෝග ජයගත් පුද්ගලයින් තිදෙනෙකුගේ ඡායාරූපයන්ය. හඳුනාගෙන නම් කරන්න.



A ........................................ B ........................................ C ........................................

02 මව්පියන් තම වටිනාම වස්තුව දරුවන් වන අතර රටක අනාගත සම්පතද දරුවෝ වෙති.

(i) එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ ප්‍රධාන තේමා 04 න් 02 ක් පහත පින්තූරයේ දක්වා ඇත. ඉතිරි තේමා දෙක ලියන්න.




A .................................................................................... B ....................................................................................

(ලකුණු 02)

(ii)



ඉහත පිංතූරයෙන් දැක්වෙන්නේ පවුලක සාමාජිකයින්ය. එම රූපයට අනුව දැක්වෙන්නේ කුමන පවුල් වර්ගයක් දැයි ලියන්න. (ලකුණු 01)

(iii) එවන් පවුලක් තුළ දැකිය හැකි ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ 04 ක් ලියන්න. (ලකුණු 04)

(iv) අයහපත් චිත්තවේග සමනය කිරීම සඳහා යොදා ගත හැකි ක්‍රියා මාර්ග 04 ක් ලියන්න. (ලකුණු 04)

03 ''වර්තමාන ලෝකයේ බොහෝ රටවල බහු සංස්කෘතික සමාජ දැකිය හැකිය.''

(i) බහු සංස්කෘතික රටක් ලෙස ශ්‍රී ලංකාවේ ජනතාව අදහනු ලබන විවිධ ආගම වර්ග වලට අයත්වන විවිධ සංස්කෘතීන් 04 ක් නම් කරන්න. (ලකුණු 04)

(ii) බහු සංස්කෘතික සමාජයක් පවතින රටක් ලෙස සලකන ඇමරිකා එක්සත් ජනපදයේ ගැටුම් ඇති නොවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග 04ක් නම් කරන්න. (ලකුණු 04)

(iii) ඉන්දීය බහු සංස්කෘතික සමාජය ඇසුරෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

| ජන වර්ග | භාෂා | ආගම් |
|---|---|---|
| 1 ........................................ | 1 ........................................ | 1 ........................................ |
| 2 ........................................ | 2 ........................................ | 2 ........................................ |

(ලකුණු 03)

04 ''වර්තමානයේ මිනිසාට මුහුණපෑමට සිදු වී ඇති අනතුරු හා විපත් විවිධාකාර වේ.''



(i) මෙම රූපයෙන් දැක්වෙන්නේ මිනිසුන් කිහිපදෙනෙක් එකතුවී කරන යම් ක්‍රියාවලියකි. එම ක්‍රියාවලිය කුමක් ද? (ලකුණු 02)

(ii) මෙම ක්‍රියාවලිය හේතු කොටගෙන සිදුවන ස්වාභාවික විපතක් නම් කරන්න. (ලකුණු 02)

(iii) ස්වාභාවික විපත් අවම කර ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග 04 ක් ලියන්න. (ලකුණු 04)

(iv) ඖෂධ භාවිතයේ දී සැලකිළිමත්විය යුතු කරුණු 03 ක් ලියන්න. (ලකුණු 05)

05 ''වර්තමානයේ ශ්‍රී ලංකාවේ මිනිස් ක්‍රියාකාරකම් නිසා සිදු වන විපත් අතර බහුලව දක්නට ලැබෙන විපතක් ලෙස මාර්ග අනතුරු හඳුනාගත හැක.''

(i) මාර්ග අනතුරු සිදුවීමට බලපාන මූලික හේතු සම්බන්ධයෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

| පදිකයන් අතින් සිදුවන වැරදි | මාර්ගවල අඩුපාඩු | වාහනවල නුසුදුසු ධාවන තත්ව |
|---|---|---|
| 1 ........................................ | 1 ........................................ | 1 ........................................ |
| 2 ........................................ | 2 ........................................ | 2 ........................................ |

(ලකුණු 06)

(ii) මාර්ග අනතුරු වලක්වා ගැනීමේ දී රජය සතු වගකීම් 03ක් ලියන්න. (ලකුණු 03)

(iii) වර්තමානයේ දුම්රිය අනතුරු බහුල වීම සඳහා බලපාන හේතු 02 ක් ලියන්න. (ලකුණු 02)

06 ''රැකියාවක වඩාත් වැදගත් වන්නේ එයින් ලැබෙන ආදායම හෝ සමාජ පිළිගැනීමටත් වඩා ඉන් සමාජයට ඉටු වන සේවයයි.''

(i) පහත සඳහන් පින්තූරයෙන් දැක්වෙන කර්මාන්තය හා එම කර්මාන්තයට ප්‍රසිද්ධ ප්‍රදේශය ලියන්න.

A කර්මාන්තය ........................................

B ප්‍රදේශය ........................................



(ලකුණු 02)

(ii) ශ්‍රමයේ ප්‍රභේද දෙක නම් කරන්න. (ලකුණු 02)

(iii) රැකියා සඳහා වෘත්තීය පුහුණුව ලබා දෙන ආයතන 04 ක් ලියන්න. (ලකුණු 04)

(iv) යම් ආයතනයක සේවය කරන සේවකයන් විසින් ඉටුකළ යුතු යුතුකම් 03 ක් ලියන්න. (ලකුණු 03)

07 පහත ඇති උපකාර පද උපයෝගී කරගෙන ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.

<u>පහළට</u>

(1) පාලන ක්‍රමයක් මෙන්ම ජීවන ක්‍රමයක් ද වේ.

(3) ඉස්ලාම් බැතිමතුන්ගේ ප්‍රධාන සංස්කෘතික උත්සවයකි.

(4) සමාජයේ සෑම පුද්ගලයන් හටම මොවුන් සිටී.

(7) යහපත් සේවා දායකයා මේවා අඩුවෙන් ගනී.

(9) පවුල හැරුනුවිට දරුවෙකුට සමීපතම ආයතනය මෙය වෙයි.

(11) ගෙඩි සෑදීමට පෙර මේවා දැක ගත හැකිය.

<u>හරහට</u>


(2) පොදු සේවාවකි.

(5) ඉන්දීය රට වාසීන් මේ නමින් හැඳින්වේ.

(6) විවිධ සංස්කෘතීන්ට අනුව මේවා වෙනස් වේ.

(8) සෑම සත්ත්වයෙක්ම මෙය භුක්ති විඳීමට කැමතිය.

(10) අවුරුදු 18 ට අඩු පුද්ගලයින් මේ නමින් හැඳින්වේ.



## I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | සංකීර්ණ | 02. | සමාන | 03. | තිරසාර සංවර්ධනය | 04. | විනීත | 05. | සේවාදායකයාට |
| 06. | ✓ | 07. | ✗ | 08. | ✓ | 09. | ✓ | 10. | ✗ |
| 11. | 2 | 12. | 3 | 13. | 4 | 14. | 1 | 15. | 2 |
| 16. | නියගය | 17. | මිලාදුන් නබි | 18. | නිල් කර පටි රැකියා | 19. | එස්. මහින්ද හිමි (ටිබෙට් ජාතික) | 20. | අයිතිවාසිකම් |

## II කොටස

01. (i) මානසික ගැටලු, ආර්ථික ගැටලු, පරිසර ගැටලු, සමාජමය ගැටලු, තාක්ෂණික ගැටලු

(ii) සුහදත්වය වර්ධනය වීම, අසහනය දුරුවීම, නිවැරදි වීම, ගැටුම් අවම වීම, සාමය ඇති වීම, සහයෝගය වර්ධනය වීම, අරමුණු ඉටුවීම.

(iii) A
- ★ පාසලට පැමිණීම දුර්වල වීම
- ★ කැපවීම අඩුවීම හා අලසකම.
- ★ අභ්‍යාසවල නොයෙදීම.
- ★ විෂය කරුණු පිළිබඳ අවබෝධය අඩු වීම.
- ★ අවධානයෙන් සවන් නොදීම.
- ★ ඉගෙනුමට සූදානම් නොවීම.

B
- ★ දිනපතා පාසල් යාම.
- ★ අවධානයෙන් පාඩමට සම්බන්ධ වීම.
- ★ අපහැදිතැන් පැහැදිලි කර ගැනීම.
- ★ පුනරීක්ෂණ අභ්‍යාසවල යෙදීම.
- ★ ඉගෙනුම් ක්‍රියාවලියට සූදානම් වී යාම.

(iv) A- නීක්ස් B - තෝමස් අල්වා එඩිසන් C - සොයිචිරෝ හොන්ඩායි

02 (i) සහභාගීත්වයට ඇති අයිතිය / පැවැත්මට ඇති අයිතිය.

(ii) විස්තෘත පවුල

(iii)
- ★ සාකච්ඡා මගින් තීරණ වලට එළඹීම.
- ★ සාමකාමීව ගැටලු නිරාකරණය කර ගැනීම.
- ★ සාමූහිකව නිවසේ වැඩ කටයුතු කර ගැනීම.
- ★ සමානාත්මතාවයෙන් කටයුතු කිරීම.
- ★ අන්මත ඉවසීම හා සවන්දීම.
- ★ නායකත්වයට හා වැඩිහිටියන්ට ගරු කිරීම.
- ★ ආදරය හා රැකවරණය ලැබීම.

(iv) භාවනා කිරීම, මල් වැවීම, ආගමික වතාවත්වල යෙදීම, මිතුරන් ඇසුරු කිරීම, නිර්මාණකරණය සඳහා යොමු වීම, චාරිකායාම, ක්‍රීඩාකටයුතුවල හා ශාරීරික ව්‍යායාම්වල යෙදීම, පරිසරය අලංකාර කිරීම.

03 (i) බෞද්ධ සංස්කෘතිය හින්දු සංස්කෘතිය, ඉස්ලාම් සංස්කෘතිය, ක්‍රිස්තියානි/ කතෝලික සංස්කෘතිය

(ii)
- ★ ඉංග්‍රීසි භාෂාව රාජ්‍ය භාෂාව ලෙස පිළිගැනීම.
- ★ කිසිදු ආගමක් රාජ්‍ය ආගමක් ලෙස නොපිළිගැනීම.
- ★ සෑම පුරවැසියෙකුටම සමාන අයිතිවාසිකම් හිමිවීම.
- ★ ප්‍රජාතන්ත්‍රවාදයට අනුව ක්‍රියා කිරීම.

(iii) ජන වර්ග - දෙමළ, උර්දු, බෙංගාලි, මුස්ලිම්, මරාති, මුණ්ඩා
භාෂා වර්ග - හින්දු, උර්දු, දෙමළ, ඉංග්‍රීසි, මරාටි, මලයාලම්, පංජාබ්, තෙලිගු, ගුජරාටි, කන්නඩා, සංස්කෘත
ආගම් වර්ග - හින්දු, කතෝලික, ඉස්ලාම්, බෞද්ධ, ශිව

04 (i) වැලි ගොඩ දමන අවස්ථාවක්

(ii) ගංවතුර, නායයාම්

(iii)
- ★ වනාන්තර විනාශ නොකිරීම සහ රුක් රෝපණ වැඩසටහන් දියත් කිරීම.
- ★ කොරල්පර කැඩීයාම වැලැක්වීම.
- ★ වෙරළතීරයේ වැලි වැටි සුරැකීම.
- ★ ගංගාවලින් වැලි ගොඩ දැමීමෙන් වැළකීම.
- ★ කඩොලාන ශාක අරක්ෂා කිරීම.
- ★ වෙරළබඩ ප්‍රදේශවල හා කඳුකර ප්‍රදේශවල අනවසර ඉදිකිරීම් නොකිරීම.
- ★ කසල අනිසිලෙස බැහැර කිරීමෙන් වැළකීම.

(iv)
- ★ නියමිත වෛද්‍ය උපදෙස් පිළිපැදීම.
- ★ නියමිත මාත්‍රාවට භාවිතා කිරීම.
- ★ නියමිත වේලාවට ඖෂධ ලබා ගැනීම.
- ★ කල්ඉකුත්වීමේ දිනය පිළිබඳ සැලකිලිමත් වීම.
- ★ භාවිතයට පෙර උපදෙස් පිළිබඳ සැලකිලිමත් වීම.

05 (i) <u>පදිකයන් අතින් සිදුවන වැරදි</u>

- ★ මාර්ග සංඥා හා මාර්ග නීති පිළිබඳ සැලකිළිමත් නොවීම.
- ★ දකුණු පසින් ගමන් නොකිරීම.
- ★ පාර මාරු වීමේ දී කහඉර භාවිතා නොකිරීම.
- ★ ජංගම දුරකතන භාවිතය.

<u>මාර්ගවල අඩුපාඩු</u>

- ★ මාර්ග කඩතොලු වීම හා ඒවායේ ජලය පිරී තිබීම.
- ★ ඉදිරිපස නොපෙනෙන පරිදි වංගු තිබීම.
- ★ තෙල් විසිරී පැවතීම.
- ★ දිය සීරාව සහිත වංගු තිබීම.

<u>වාහනවල නොසුදුසු ධාවන තත්ත්ව</u>

- ★ ප්‍රධාන පහන් උචිත පරිදි ක්‍රියාත්මක නොවීම.
- ★ තිරිංග පද්ධති නිසියාකාරව ක්‍රියාත්මක නොවීම.
- ★ ගෙවීගිය ටයර් භාවිතය.
- ★ සංඥා පහන් නොමැතිව ධාවනය.

(ii)
- ★ මාර්ග නිසි පරිදි නඩත්තු කිරීම.
- ★ රියදුරු පුහුණුව විධිමත් කිරීම.
- ★ වේග සීමා හා සංඥා මාර්ග දෙපස ඉදි කිරීම.
- ★ රියදුරන් දැනුවත් කිරීම හා පදිකයන් දැනුවත් කිරීම.

(iii)
- ★ දුම්රිය මාර්ගයේ පදිකයන් ගමන් කිරීම.
- ★ දුම්රිය මාර්ග සංඥා නොතකා රථ වාහන ධාවනය කිරීම.
- ★ හරස් පාරවල් වල දී ආරක්ෂිත ගේට්ටු නොතිබීම.
- ★ දුම්රිය මාර්ග දෙපස අනාරක්ෂිත ලෙස පදිංචි වී සිටීම.

06 (i) A - වේවැල් B - වේවැල්දෙණිය

(ii) කායික ශ්‍රමය, මානසික ශ්‍රමය

(iii) වෘත්තීය පුහුණු අධිකාරිය, ජාතික අධුනිකත්ව මණ්ඩය, ජාතික තරුණ සේවා සභාව, කාර්මික විද්‍යාලය, උසස් තාක්‍ෂණ ආයතනය, නැණසල, විදාතා මධ්‍යස්ථානය

(iv) නියමිත වේලාවට සේවයට පැමිණීම, මහන්සි වී වැඩ කිරීම, සේවා අවශ්‍යතා ඉටුකර දීම, යහපත් පැවැත්මෙන් යුතුවීම, සේවා ස්ථානයේ දේපල අරක්ෂා කිරීම, ගෞරවය අරක්ෂා කිරීම.

07

| <u>පහළට</u> | | <u>හරහට</u> | |
|---|---|---|---|
| (1) | ප්‍රජාතන්ත්‍රවාදය | (2) | ප්‍රවාහනය |
| (3) | හජ් | (5) | ඉන්දියානුවන් |
| (4) | යහළුවන් | (6) | චාරිත්‍ර |
| (7) | නිවාඩු | (8) | නිදහස |
| (9) | පාසල | (10) | ළමයි |
| (11) | මල් | | |